# කුමාරගමගේ කවියෙන් මතුවන මානව දයාව

**මෙම ලිපියේ මුල්කොටස පසුගිය අඟහරුවාදා (ජනවාරි 4) විමංසා පිටුවේ පළවිය.**

ස්වභාව සෞන්දර්යය හා කවියා:

විමලරත්න කුමාරගම කවියා ස්වභාව සෞන්දර්යය වර්ණනයේ දී වඩාටම ආවේණික වූ අපූර්වත්වයක් ඇති අත්දැකීම් වස්තු විෂය කොට ගත්තේය. එහිදී ද ජීවිතය, සමාජය, හා මිනිසා පිළිබඳ ගැඹුරු සමාජ දර්ශනයක් ගැබ් වී තිබුණි. වනය මැද වෙඩි වැදී මිය ගිය මුව දෙනකගේ දුක්බර දුවත ශමිෂෙස් දක්වා ඇත.

දාගිය අතු පඳුරු ගිත්තෙත් තිකිණි මෙන්
සෝකිව ඇඹිරෙමින් වැළපෙන හැටිය ඇසේ
ඉඳහිට සුළඟ හමනී ඩා නිවන ලෙසේ
හැඳවත සිරස බිර මිම් තිදියම් ද නෙසේ

හිකිණි මනේ නද නියඟයෙන් ගම්මානයේ අතු පඳුරු වියළී ගොස්ය. එම ගස්වැල් ගින්නෙන් උණුසුම උහුලණු නොහැකිව ඇඹරෙමින් පවතින ආකාරයක් පෙන්නුම් කරයි. සොබා දහමට සංවේදනීයත්වයක් ආරෝපණය කළ අයුරුයි මේ ! නද රශ්මියක් සිරුරට දැනෙන විට සත්වයන් ද ඇඹරෙමින් ඇත් වෙයි. ''අතු පඳුරු සෝකිව ඇඹරෙමින් වැළපෙන අයුරුත් පෙන්නුම් කරයි. කුමාරගම කවියාගේ ප්‍රතිභා ශක්තිය පෙන්නුම් කරන කදිම අවස්ථාවකි. හමන සුළඟ ඉඳහිට නවතී. හදවත සහ සිරස හැඟීම්වලින් පෙරපීම නිසා නිදි වර්ජිතව පසුවෙයි. කවියා මැවූ චිත්‍ර රූපය කවියා වචන හසුරුවා ඇති ආකාරයෙන් පාඨකයාගේ භාවයන් සසල කිරීමට සමත් විය.

යටිකුරු සුනිල් දුම් ගොබයක් වැනිය හිස
සැන්දෑ වලාවක ඉඳුනිල් මිණිය ඇස
පන්සල වෙහෙර ළිඳ ළඟ ඇ නදිය ඇස
ඇය දැක ගන්ට හැඬුවා ගම තරුණ ඇස

කාන්තාවගේ රූ සපුව ගැන කීමේදී අපූර්වත්වයෙන් යුත් උපමා රූපක භාවිත කර ඇත. ස්වභාව සෞන්දර්යය සහ ගැහැනිය පිළිබඳ කාව්‍ය සංකල්පනාවලදී. කුමාරගම කවියා ඉංග්‍රීසි රොමැන්ටික් කවීන්ගෙන් මෙන්ම රවීන්ද්‍රනාත් තාගෝර් පඬිවරයාගේ කෘතිවලින්ද ආභාසය ලබා ඇති බවත්, පෙනෙන්නට තිබේ.

මානව දයාවෙන් පිරි කුමාරගම:

ඔහු කවි ලියුවේ හුදු තාවකාලික විනෝදයක් ලබනු රිසින් නොව, සමාජය මිනිසා හා ජීවිතය විවරණය කිරීම සඳහාය. වන්නි හත් පත්තුවේ ජීවත් වන මිනිසුන් ගැන පමණක් නොව එහි වසන සතා, සිවුපාවුන්ගේ දුක් පීඩා ද ඔහුගේ අනුකම්පාවට ලක් විය. කවියාගේ මානව භක්තිය සිවුපා සතුන් කෙරෙහි ද අඩුවක් නොවිය.

වලස් දඩයම සිරගෙය සහ යන්තම ගැලවුණා ආදී පද්‍ය රචනා නිරීක්ෂණය කරන විට පෙනී යන්නේ ඔහු වනයේ සිවුපා සතුන් වෙත දැක්වූ දයානු කම්පාවය. වනාන්තරවල ජීවත් වන වන සතුන් මුහුණපාන භයානක අතවරයන් කවියාගේ මහත් අනුකම්පාවට ලක් විය. එම භයානක සිදුවීම් කියවන්නාගේ හදවත දැඩි ලෙස සසල කරවන අයුරින් කවියට නගා ඇත්තේ දැඩි මානව භක්තියකිනි.

හැදිසියෙ දුටිම් කටවත් වැව වෙන ඇදෙන
වැලහින්නක්ය ඇය පසුපස දරු දෙදෙන
යම්තම් ඇසුණි හඬ පැටවුන් දිය අදින
කැටවල තුළින් එතෙනෙණි වෙඩි හඬ ඇසිණ

(වලස් දඩයම)

වෙඩි වැදීමෙන් වැලහින්න මිය යයි. දරු පැටවුන් තනි වී අසරණ වෙයි. මවක නැති වීමෙන් දරුවන්ගේ ශෝකාන්තය කවියාගේ වස්තු විෂය විය ''හදවත පෙලී පැටවුන් වැළපෙන සද්දේ'' සංවේගයෙන් මා සිටි මැස්ස ද ගැස්සේ''

වලස් දඩයම පැදි පෙළින් කවියාගේ මානව දයාවත් මවකගේ ආදරයෙන් වෙන්වූ දරුවන්ගේ ශෝක ජනක මොහොතක් සිතුවම් කර පෙන්වයි. මවු සෙනෙහස ගැන ගැඹුරු ජීවන දර්ශනයක් පාඨකයා වෙත තබයි.

''දරුවන් දකින විට සිය මෑණියන් නැති
ඒ හැම දෙනම මගෙ ළඟ නෑසියන් වෙති''

මවගෙන් වියෝවුණු අසරණ දරුවන් කවියා දකින්නේ ඒ හැම දෙනාම තමාගේ ළඟ නෑයින් ලෙසය. කවියාගේ මානව භක්තිය කොතරම් දැයි සිතා ගත හැකිය.

කුමාරගම ජීවන පරිඥානයකින් විවිධ අත්දැකීම්වලත් පරිනත වී සිටි කවියෙකු බව ඔහුගේ පැදිවලින් තහවුරු වේ. ඔහු වන්නියේ දැඩි හිරු රැසින් නැහැවෙමින් කටුක ආහාර ගනිමින් ගැමියා සමග දුක් ගිරහැරවලට මුහුණ දෙමින් දහසක් අත්දැකීම් ලබා යත්තේය. කවියා කලාකරුවා එක්ටැම් ගෙයක සිර වී ජීවත් වන්නකු නොවන බව ඔහු පහදා දුන්නේය. මහෝශාකා ජීවිතයක් ගත කරන්නට ඉඩ තිබිය දී ඔහු 43 වියේදී ජීවිතයෙන් සමුගන්නා විට තරුණ විය යමතම පසුකලා පමණි.

**සෝමදාස ගෝමස්**